# **කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේදීය.**

2024 අංක 9 දරණ මාර්ගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ 24 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන්නා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් වන කාරණාවක් සම්බන්ධයෙනි.

ජනක රත්නායක,
අංක 41/27, 3 වන පටුමග,
D M කොළඹගේ මාවත,
කිරුළපන,
කොළඹ 5.

**පෙත්සම්කරු**

නඩු අංක :

**-එරෙහිව-**

1. පොල්වත්තේ ඉල්ලන්පෙරුම ආරච්චිගේ ගයත්‍රි බිම්බා
   අංක 24/5/1 සඳරැස්වත්ත,
   මිරිස්වත්ත,
   පුවක්පිටිය.

   සහ

   No. 66 *Dachengli*,
   Guantian District,
   Tainan City,
   Taiwan 70005.

2. ජනක රාජපක්ෂ
   අංක 90/A,
   කොට්ටාව පාර,
   මිරිස්වත්ත,
   පිළියන්දල.

   සහ

   No. 66 *Dachengli*,
   Guantian District,
   Tainan City,
   Taiwan 70005.

3. ඔශල හේරත්
   අංක 22
   වට මාවත,
   පිළියන්දල.

4. යසලාල් පෙරේරා.
අංක 14,
ඩඩ්ලි සේනානායක මාවත,
පානදුර,

5. කල්ප ගයාන් කවීශ්වර ගුණරත්න
.
.
.

6. ජාමුණි කමන්ත තුශාර
අංක 67, නන්දන,
අලුවිල,
පානදුර.

7. WhatsApp LLC
Headquarters
1 Meta Way,
Menlo Park,
California 94025,
United States of America

8. Google LLC, D/B/A
Youtube
Headquarters
901 Cherry Avenue,
San Bruno,
California 94066,
United States of America.

**<u>වගඋත්තරුවන්</u>**

**වර්ෂ 2024 ක් වූ අප්‍රේල් මස  වන දින දීය.**

ඉහත නම් සදහන් පෙත්සම්කරු තම **<u>නීතිඥ මිතුන් ඩයස් මහතා</u>** මගින් පෙනී සිටිමින් ඉදිරිපත් කරන්නා වූ තම පෙත්සමෙන් මෙසේ ප්‍රකාශ කර සිටී.

1. මෙම ඉල්ලීමට අදාල සෑම සියලු අවස්ථාවකදීම ඉහත පෙත්සම්කරු මෙම පෙත්සමේ ශීර්ෂයේ දක්වා ඇති ලිපිනයේ පදිංචිව සිටින බව පෙත්සම්කරු ප්‍රකාශ කර සිටියි.

2. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, පෙත්සම්කරු වෘත්තියෙන් ව්‍යාපාරිකයකු වන බවත්, සමාගම් කිහිපයක සභාපති වශයෙන් කටයුතු කරන බවත්, ඔහු 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙහි සභාපති වශයෙන් කටයුතු කර ඇති බවත්, ඊට පෙර ද වෙනත් සමාගම් ගණනාවක සභාපති වශයෙන් සහ වෙනත් තනතුරු හොබවමින් කටයුතු කළ බවත්, පෙත්සම්කරු, ශ්‍රී ලංකාවෙහි ඉහළ කීර්තියක් ලබා ඇති පුද්ගලයකු වන බවත්ය.

පෙත්සම්කරුගේ ඉහත වෘත්තිමය කාරණා තහවුරු කිරීමට ගරු අධිකරණය විසින් අවශ්‍යය යැයි තීරණය කළහොත් ඒ සම්බන්ධයෙන් ලේඛණ මෙම ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමේ අයිතිය පෙත්සම්කරු මේ අවස්ථාවේ විශේෂයෙන් රඳවා තබා ගනී.

3. පෙත්සම්කරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, මින් ඉදිරියට පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාද සමාජවාදී ජනරජයෙහි ජනාධිපතිවරණය සඳහා පෙත්සම්කරු අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වන බවට දැනටමත් ජනමාධ්‍ය ඔස්සේ සහ සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රකාශයට පත් කර ප්‍රසිද්ධියට පත් කර ඇති බවයි.

4. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත නම් සඳහන් 1 වන වගඋත්තරකාරිය 1999 වර්ෂයෙහි හෝ ඊට ආසන්න කාලයක දී පෙත්සම්කරුගේ ආයතනයක සේවය ආරම්භ කරන ලද බවත්, වසර දෙකකට පමණ පසු ඇය සේවයෙන් ඉවත්ව ගිය බවත්, නැවත 2007 වර්ෂයේ හෝ ඊට ආසන්න කාලයක දී පෙත්සම්කරුගේ සමාගමක නැවත සේවයට පැමිණි බවත්, ඉන්පසු පෙත්සම්කරුගේ පෞද්ගලික සහායිකාව (Personal Assistant) ලෙස සහ පෙත්සම්කරුට අයත් සහ පෙත්සම්කරු හා සම්බන්ධ නොයෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතනයන් හී නොයෙකුත් තනතුරු දරමින් සේවය කරන ලද බවත්, 2023 වර්ෂයෙහි මැයි මාසයෙහි දී පමණ වගඋත්තරකාරිය පෙත්සම්කරු යටතේ සේවය නවතා ඉවත්ව ගිය බවත්ය.

5. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත නම් සඳහන් 2 වන වගඋත්තරකරු පහත සවිස්තරාත්මකව දක්වා ඇති පෙත්සම්කරු සම්බන්ධයෙන් පෞද්ගලික තොරතුරු සහ/හෝ තහනම් ප්‍රකාශයන් සන්නිවේදනය කළ සහ/හෝ සන්නිවේදනය කිරීමට සූදානම්ව සිටින කෙනෙකු වන බවත්, ඒ අනුව පෙත්සම්කරුට 2024 අංක 9 දරණ පනතේ විධිවිධාන ප්‍රකාරව 2 වන වගඋත්තරකරුට එරෙහිව කටයුතු කිරීමට සහ/හෝ නියෝග ඉල්ලා සිටීමට අයිතිය ඇති බවට පෙත්සම්කරුට උපදෙස් ලබා දී ඇති බවත්ය.

6. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත 3 වන වගඋත්තරකරු පහත සවිස්තරාත්මකව දක්වා ඇති පෙත්සම්කරු සම්බන්ධයෙන් පෞද්ගලික තොරතුරු සහ/හෝ තහනම් ප්‍රකාශයන් සන්නිවේදනය කළ සහ/හෝ සන්නිවේදනය කරමින් සිටින සහ/හෝ සන්නිවේදනය කිරීමට සූදානම්ව සිටින අයකු වන බවත්, ඒ අනුව පෙත්සම්කරුට 2024 අංක 9 දරණ පනතේ විධිවිධාන ප්‍රකාරව 3 වන වගඋත්තරකරුට එරෙහිව කටයුතු කිරීමට සහ/හෝ නියෝග ඉල්ලා සිටීමට අයිතිය ඇති බවට පෙත්සම්කරුට උපදෙස් ලබා දී ඇති බවත්ය.

7. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත 4 වන, 5 වන සහ 6 වන වගඋත්තරකරුවන් පහත සවිස්තරාත්මකව දක්වා ඇති පෙත්සම්කරු සම්බන්ධයෙන් පෞද්ගලික තොරතුරු සහ/හෝ තහනම් ප්‍රකාශයන් සන්නිවේදනය කළ සහ/හෝ සන්නිවේදනය කරමින් සිටින සහ/හෝ සන්නිවේදනය කිරීමට සූදානම්ව සිටින අය වන බවත්, ඒ අනුව පෙත්සම්කරුට 2024 අංක 9 දරණ පනතේ විධිවිධාන ප්‍රකාරව 4 වන, 5 වන සහ 6 වන වගඋත්තරකරුවන්ට එරෙහිව කටයුතු කිරීමට සහ/හෝ නියෝග ඉල්ලා සිටීමට අයිතිය ඇති බවට පෙත්සම්කරුට උපදෙස් ලබා දී ඇති බවත්ය.

8. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත 7 වන වගඋත්තරකරු පහත සවිස්තරාත්මකව දක්වා ඇති පෙත්සම්කරු සම්බන්ධයෙන් පෞද්ගලික තොරතුරු සහ/හෝ තහනම් ප්‍රකාශයන් සන්නිවේදනය වූ සහ/හෝ සන්නිවේදනය වීමට හැකි "අන්තර්ජාල අතුරුමැදියකු" වන බවත්, ඒ අනුව පෙත්සම්කරුට 2024 අංක 9 දරණ පනතේ විධිවිධාන ප්‍රකාරව 7 වන වගඋත්තරකරුට

එරෙහිව කටයුතු කිරීමට සහ/හෝ නියෝග ඉල්ලා සිටීමට අයිතිය ඇති බවට පෙත්සම්කරුට උපදෙස් ලබා දී ඇති බවත්ය.

9. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත 8 වන වගඋත්තරකරු පහත සවිස්තරාත්මකව දක්වා ඇති පෙත්සම්කරු සම්බන්ධයෙන් පෞද්ගලික තොරතුරු සහ/හෝ තහනම් ප්‍රකාශයන් සන්නිවේදනය වූ සහ/හෝ සන්නිවේදනය වීමට හැකි "අන්තර්ජාල අතුරුමැදියකු" වන බවත්, ඒ අනුව පෙත්සම්කරුට 2024 අංක 9 දරණ පනතේ විධිවිධාන ප්‍රකාරව 8 වන වගඋත්තරකරුට එරෙහිව කටයුතු කිරීමට සහ/හෝ නියෝග ඉල්ලා සිටීමට අයිතිය ඇති බවට පෙත්සම්කරුට උපදෙස් ලබා දී ඇති බවත්ය.

10. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, පෙත්සම්කරුගේ උපරිම දැනීම පරිදි මෙම ඉල්ලීමට අදාව සෑම සියලු අවස්ථාවකදීම ඉහත 1 වන සිට 6 වන වගඋත්තරකරුවන් පෙත්සමේ ශීර්ෂයේ දක්වා ඇති ලිපිනයන් හී පදිංචිව සහ/හෝ ස්ථාපිතව සිටින බවත්, **2024 අංක 9 දරණ මාර්ගත ක්‍රම වල සුරක්ෂිතභාවය පිළිබද පනතේ 24 වන වගන්තියේ** දක්වා සිටින **"තැනැත්තා"** යන අර්ථ නිරූපනය තුලට වැටෙන්නා වූ අයවලුන් වන බවත් පෙත්සම්කරු ප්‍රකාශ කර සිටී.

11. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, පෙත්සම්කරුගේ උපරිම දැනීම පරිදි මෙම ඉල්ලීමට අදාව සෑම සියලු අවස්ථාවකදීම ඉහත 7 වන සහ 8 වන වගඋත්තරකරුවන් පෙත්සමේ ශීර්ෂයේ දක්වා ඇති ලිපිනයන් හී ස්ථාපපිතව සිටින බවත්, **2024 අංක 9 දරණ මාර්ගත ක්‍රම වල සුරක්ෂිතභාවය පිළිබද පනතේ 24 වන වගන්තියේ** දක්වා සිටින **"අන්තර්ජාල අතුරුමැදියකු"** යන අර්ථ නිරූපනය තුලට වැටෙන්නා වූ තැනැත්තන් වන බවත් පෙත්සම්කරු ප්‍රකාශ කර සිටී.

12. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, මින්මතුවට සවිස්තරව දක්වා ඇති ආකාරයට පෙත්සම්කරුට අදාලව "**තහනම් ප්‍රකාශයක් සහ/හෝ ප්‍රකාශයන්" සන්නිවේදනය කළ සහ/හෝ සන්නිවේදනය කිරීමට මුදවා හැරීම සහ/හෝ මුදවා හැරීමට තැත් කිරීම** යන ක්‍රියාවන් **ඉහත 1 සිට 6 දක්වා වගඋත්තරකරුවන් සිදු කළ බවත් සහ/හෝ සිදු කරන බවත් සහ/හෝ සිදු කිරීමට සූදානම්ව සිටින බවත්,** ඒ අනුව, **2024 අංක 9 දරණ පනතේ "තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය වීමෙන් බලපෑමට ලක් වී ඇති තැනැත්තෙකු"** ලෙස පෙත්සම්කරුට උක්ත පනතේ 24 (1) වගන්තිය යටතේ මෙම ඉල්ලීම ඉදිරිපත් කිරිමට නීතිමය අයිතියක් ඇති බවට පෙත්සම්කරු හට උපදෙස් ලැබී ඇති බවත්ය.

13. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත 7 සහ 8 වන වගඋත්තරකරුවන් වශයෙන් නම්කර ඇති පාර්ශවයන් මෙම ඉල්ලීමට අදාල සෑම සියලු අවස්ථාවකදීම පෙත්සම්කරුට අදාලව තහනම් ප්‍රකාශයන් සන්නිවේදනය කර ඇති අන්තර්ජාල සේවා සපයන්නන් සහ/හෝ "අන්තර්ජාල අතරමැදියන්" වශයෙන් කටයුතු කල බව පෙත්සම්කරු ප්‍රකාශ කර සිටියි. එබැවින් ඉහත සියලුම වගඋත්තරකරුවන්ට අදාලව 2024 අංක 9 දරණ මාර්ගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබද පනතේ 24(2) වගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් ඉල්ලා සිටීමට පෙත්සම්කරුට නීතිමය අයිතියක් ඇති බවට පෙත්සම්කරු ප්‍රකාශ කර සිටී.

14. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, 1 වන වගඋත්තරකාරිය වසර ගණනාවක් පෙත්සම්කරු සමග ඉතා සමීපව ආශ්‍රය කළ බවත්, ඒ සමීප ආශ්‍රය හේතුකොටගෙන වගඋත්තරකාරිය හට පෙත්සම්කරුගේ නොයෙකුත් වෘත්තීමය සහ පෞද්ගලික තොරතුරු සහ/හෝ රහසිගත (confidential) තොරතුරු තිබූ බවත් සහ/හෝ තිබෙන බවත් සහ/හෝ තිබීමට අවකාශය තිබූ බවත්ය.

15. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, 2006 වර්ෂයේ හෝ ඊට ආසන්න කාලයක සිට පෙත්සම්කරු සහ 1 වන වගඋත්තරකාරිය අතර ඉතා සමීප සම්බන්ධතාවයක් ඇති වූ බවත්, දෙදෙනා අතර ලිංගික සබඳතාවයක් ඇති වුණ බවත්, එම සම්බන්ධතාවය විවෘත සම්බන්ධතාවයක් වූ බවත්, 1 වන වගඋත්තරකාරියගේ පූර්ණ කැමැත්ත ඇතිව පෙත්සම්කරු සහ 1 වන වගඋත්තරකාරිය ලිංගිකව හැසුරුණු අවස්ථා ගණනාවක් දෙපාර්ශවය විසින් වීඩියෝගත කිරීම් සහ ඡායාරූප ගත කර ඇති බවත්, එවැනි විඩියෝගත කිරීම් සහ ඡායරූප ගණනාවක් කල්යත්ම එකතු වූ බවත්ය.

16. පෙත්සම්කරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, පෙත්සම්කරු සහ 1 වන වගඋත්තරකාරිය අතර තිබූ සමීප සම්බන්ධතාවය සහ විශ්වාසය මත එකී විඩියෝ දර්ශන සහ ඡායරූප සහ පෙත්සම්කරුට සම්බන්ධ වෙනත් පෞද්ගලික වීඩියෝ දර්ශන සහ ඡායාරූප සියල්ල 1 වන වගඋත්තරකාරියගේ භාරයේ සහ සන්තකයේ තිබූ බවත් සහ හෝ එකී විඩියෝ දර්ශන සහ ඡායරූප සඳහා ප්‍රවේශ වීමට සියළු මුරපදයන් 1 වන වගඋත්තරකාරිය සතුව තිබූ බවත්ය.

17. පෙත්සම්කරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, එකී මුරපදයන්ට අමතරව පෙත්සම්කරුගේ සියළු ජංගම දුරකථනවලට අදාල මුරපදයන්, පෙත්සම්කරුගේ පෞද්ගලික දත්ත ගබඩාවට (iCloud) අදාළ මුරපදයන් ඇතුළු පෙත්සම්කරුගේ පෞද්ගලික සහ වෘත්තීමය සහ සමාජීය ගිණුම් හී ද, පෙත්සම්කරුට අයත් විද්‍යුත් තැපැල් හී ද ප්‍රවේශය සහ/හෝ ඒවා සම්බන්ධ මුරපදයන් සියල්ල එකී වෘත්තිමය සම්බන්ධතාවය සහ සමිප සම්බන්ධතාවය හේතුවෙන් 1 වන වගඋත්තරකාරිය සතුව තිබූ බවයි.

18. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, පෙත්සම්කරු සහ 1 වන වගඋත්තරකාරිය අතර තිබූ ඉහත කී සමිප සම්බන්ධතාවය 2023 වර්ෂයෙහි මැයි මසයේ දී පමණ බිඳී ගිය බවත්, එකී සම්බන්ධතාවය අවසන් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් පහත සඳහන් සිද්ධිමය කරුණුවලට පෙත්සම්කරු හට මුහුණ දීමට සිදු වී ඇති බවත්ය.

19. තවද, පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, පෙත්සම්කරු සහ 1 වන වගඋත්තරකාරිය අතර තිබූ සම්බන්ධතාවය බිඳ වැටීමෙන් පසුව පෙත්සම්කරුට දැන ගැනීමට ලැබුණේ, 1 වන වගඋත්තරකාරිය විසින් ඉහත කී විඩියෝ දර්ශන සහ ඡායාරූප එකතුව වෙත පෙත්සම්කරු හට, ඇති ප්‍රවේශය ඉවත් කර ඒ සියළු විඩියෝ දර්ශන සහ ඡායාරූපයන් හී සන්තකය 1 වන වගඋත්තරකාරියගේ තනි භාරයට ගෙන ඇති බවත්, ඒවායෙහි පූර්ණ පාලනය සහ තනි ප්‍රවේශය 1 වන වගඋත්තරකාරියට නතු කර ගෙන ඇති බවත්ය.

20. පෙත්සම්කරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, මින්මතුවට සවිස්තරව දක්වා ඇති 1 සිට 6 වන වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් සහ/හෝ ප්‍රකාශයන් එක්ව සහ/හෝ වෙන් වෙන්ව 2024 අංක 9 දරණ පනතේ 20 වන වගන්තියේ විෂය පථය තුළට ඇතුළත් වන බවයි.

21. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, 2023 වර්ෂයේ ජූලි මස හෝ ඊට ආසන්න කාලයක දී පෙත්සම්කරුගේ සමිප මිතුරැකු වන මහාචාර්ය මුදිත විදානපතිරණ මහතා පෙත්සම්කරු හට දන්වා සිටියේ, පෙත්සම්කරු නැවත 1 වන වගඋත්තරකාරිය සමග සම්බන්ධ වීමට උත්සාහ කළහොත් 1 වන වගඋත්තරකාරිය සතුව ඇති ඉහත කී වීඩියෝ දර්ශන සහ/හෝ ඡායරූප සමාජයට මුදවා හරින බවට ඉහත නම් සඳහන් 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් එකී මහාචාර්ය මුදිත විදානපතිරණ මහතා හට අවවාද කර ඇති බවයි.

22. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, 2023 වර්ෂයෙහි ජූලි මස හෝ ඊට ආසන්න කාලයක දී, පෙත්සම්කරුගේ මිතුරකු ආශ්‍රයෙන් දැනගැනීමට ලැබුණේ ඉහත නම් සඳහන් 3 වන වගඋත්තරකරු විසින් පෙත්සම්කරුගේ යැයි කියන්නා වූ විඩියෝ දර්ශන කිහිපයක් පෙත්සම්කරුගේ එකී මිතුරා හට හුවමාරු කර (share) ඇති බවයි.

ඒ බව සනාථ කිරීමට එකී විඩියෝ දර්ශන අන්තර්ගත සංයුක්ත තැටියක් "X1" ලෙස ලකුණු කර මේ සමග ඉදිරිපත් කරන අතර, එය මෙහිම කොටසක් ලෙස පිළිගන්නා මෙන් ගෞරවයෙන් අයැද සිටී.

23. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, එකී වීඩියෝ දර්ශන නැරඹීමෙන් පෙත්සම්කරු හට ස්ථිර වශයෙන් වැටහී ගියේ එකී විඩියෝ දර්ශණ 1 වන වගඋත්තරකාරිය සහ/හෝ 2 වන වගඋත්තරකරු විසින් WhatsApp සමාජ මාධ්‍ය ජාලයට (7 වන වගඋත්තරකරු ලෙස නම් කර ඇති) මුදවා ඇති බවත්, සහ එවැනි අනෙකුත් විඩියෝ දර්ශන ඒ ආකාරයෙන්ම මුදවා හැරීමට සහ/හෝ සන්නිවේදනය කිරීමට 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන වගඋත්තරකරුවන් එක්ව සහ/හෝ වෙන් වෙන්ව සූදානම්ව සිටින බවයි.

24. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, කරුණු එසේ තිබිය දී 1 වන වගඋත්තරකාරිය විසින් 2024 වර්ෂයේ මාර්තු 7 වන දින හෝ ඊට ආසන්න දිනක දී "ටෝක් විත් ලාල්" (Talk With Lal) නම් ඉහත නම් සඳහන් 4 වන වගඋත්තරකරුගේ Youtube නාලිකාවෙහි (8 වන වගඋත්තරකරු ලෙස නම් කර ඇති) සාකච්ඡාවකට ඉදිරිපත් වී පෙත්සම්කරුව ඉලක්ක කොට වෙනත් දේ අතර පහත සඳහන් දෑ ප්‍රකාශ කරන ලද බවයි. එනම්;

අ. පෙත්සම්කරු 1 වන වගඋත්තරකාරියට මරණ තර්ජණය කළ බවත්,

ආ. පෙත්සම්කරු නොයෙකුත් පුද්ගලයින්ට අල්ලස් ලබා දී ඇති බවත්,

ඇ. පෙත්සම්කරු 1 වන වගඋත්තරකාරියට හිරිහැර කර ඇති බවත්ය.

25. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, එකී සාකච්ඡාව ඉහත සඳහන් "ටෝක් විත් ලාල්" (Talk With Lal) යන 4 වන වගඋත්තරකරුගේ Youtube නාලිකාවෙහි "ජනක රත්නායක කාන්තාවකට හිරිහැර කරලා" යන මාතෘකාව යටතේ 2024 වර්ෂයේ මාර්තු මස 7 වන දින ප්‍රකාශනය කර ඇති බවත්, එකී සාකච්ඡාව හෙබවූයේ ඉහත නම් සඳහන් 6 වන වගඋත්තරකරු වන බවත්ය.

ඒ බව සනාථ කිරීමට එකී Youtube විඩියෝව අන්තර්ගත සංයුක්ත තැටියක් "X2" ලෙස ලකුණු කර මේ සමග ඉදිරිපත් කරන අතර, එය මෙහිම කොටසක් ලෙස පිළිගන්නා මෙන් ගෞරවයෙන් අයැද සිටී.

26. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, තවද, 1 වන වගඋත්තරකාරිය විසින් 2024 වර්ෂයෙහි මාර්තු මස 17 වන දින හෝ ඊට ආසන්න දිනක දී "මී මැස්සෝ ටීවී" (Mee Massoo TV) නම් ඉහත සඳහන් 5 වන වගඋත්තරකරුගේ Youtube නාලිකාවෙහි (7 වන වගඋත්තරකරු ලෙස නම් කර ඇති) සම්මුඛ සාකච්ඡාවකට ඉදිරිපත් වී පෙත්සම්කරුව ඉලක්ක කොට වෙනත් දේ අතර පහත සඳහන් දෑ ප්‍රකාශ කරන ලද බවයි. එනම්;

අ. පෙත්සම්කරු 1 වන වගඋත්තරකාරියට මරණ තර්ජණය කළ බවත්,

ආ. පෙත්සම්කරු නොයෙකුත් පුද්ගලයින්ට අල්ලස් ලබා දී ඇති බවත්,

ඇ. පෙත්සම්කරු ලිංගික දර්ශන පෙන්වා 1 වන වගඋත්තරකාරියව රහෝතර්ජනය (Blackmail) කිරීමට උත්සාහ කර ඇති බවත්,

ඈ. පෙත්සම්කරු 1 වන වගඋත්තරකාරියට හිරිහැර කර ඇති බවත්ය.

27. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, එකී සම්මුඛ සාකච්ඡාව ඉහත සඳහන් "මී මැස්සෝ ටීවී" (Mee Massoo TV) යන 5 වන වගඋත්තරකරුගේ Youtube නාලිකාවෙහි "ලිංගික දර්ශන පෙන්වලා මාව බ්ලැක්මේල් කරන්න හැදුවා" යන මාතෘකාව යටතේ 2024 වර්ෂයේ මාර්තු මස 17 වන දින ප්‍රකාශනය කර ඇති බවයි.

ඒ බව සනාථ කිරීමට එකී Youtube විඩියෝව අන්තර්ඝත සංයුක්ත තැටියක් "X3" ලෙස ලකුණු කර මේ සමග ඉදිරිපත් කරන අතර, එය මෙහිම කොටසක් ලෙස පිළිගන්නා මෙන් ගෞරවයෙන් අයැද සිටී.

28. පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත "X2" සහ "X3" ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති සංයුක්ත තැටියන් හී අන්තර්ඝත විඩියෝ දර්ශණයන් හී 1 වන වගඋත්තරකාරිය විසින් පෙත්සම්කරු සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්නා වූ කාරණයන් පෙත්සම්කරු ඉලක්කගත කර ගෙන කරන්නා වූ කාරණයන් වන බවත්, ඒවායින් නොයෙකුත් හිරිහැර මේ වන විටත් මුහුණ දීමට පෙත්සම්කරු හට සිදු වී ඇති බවත්ය.

29. එසේ හෙයින් පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන වගඋත්තරකරුවන්ගේ ඉහත කී ක්‍රියාවන් සහ/හෝ ප්‍රකාශයන් එක්ව සහ වෙන් වෙන්ව;

අ) පෙත්සම්කරු ඉලක්කගත කොට (Targeted) සිදුකර ඇති බවත්, සහ

ආ) ඒ අනුව පෙත්සම්කරු උක්ත පනතේ 20(1) වගන්තිය යටතේ දක්වා ඇති **"ඉලක්ක ගත තැනැත්තෙකු (Targeted person)"** වන බවත්,

ඇ) 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන වගඋත්තරකරුවන් විසින් මින්මතුවට දැක්වෙන ආකාරයට පෙත්සම්කරු ඉලක්කගත කොට පෙත්සම්කරුට හිරිහැර කිරිමේ චේතනාවෙන් පෙත්සම්කරුට අදාල පෞද්ගලික තොරතුරුක් පලකිරිමට සහ/හෝ පලකිරිමට හා සන්නිවේදනය කිරිමට කටයුතු කර ඇති බවත් සහ/හෝ පලකිරිමට හා සන්නිවේදනය කිරිමට කිරීමට උත්සාහ කරන බවත්,

ඈ) එම ක්‍රියාවන් සහ/හෝ ප්‍රකාශයන් හී ප්‍රතිඵලයක් වශයෙන් පෙත්සම්කරුට හිරිහැරයක් සිදු වී ඇති බවත් සහ/හෝ සිදු වීමට ඇති බවත්,

ඉ) උක්ත සන්නිවේදනය කිරීම සහ/හෝ සන්නිවේදනය කිරීමට සූදානම් වීම 2024 අංක 9 දරණ පනතේ 52 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට අන්තර්ජාලය තුළ හෝ

අන්තර්ජාලය මගින් ශ්‍රී ලංකාව තුළ සිටින එක් අවසාන පරිශීලකයෙකුට හෝ ඊට වැඩි සංවාසයකට පෞද්ගලික තොරතුරක් සන්නිවේදනය සිදු කිරීමක් සහ/හෝ බෙදා හැරීමක් සහ/හෝ හුවමාරු කර ගැනීමක් සහ/හෝ ජනනය කිරීමක් සහ/හෝ ප්‍රචාරය කිරීමක් සහ/හෝ පල කිරීමක් සහ/හෝ අයැදිමක් වන බවත් සහ/හෝ එවැන්නක් වීම අවකාශය ඇති බවත්ය.

ඊ) ඒ අනුව එම ක්‍රියාව සහ/හෝ ක්‍රියාවන් 2024 අංක 9 දරණ පනතේ 20(1) වගන්තිය යටතේ සාපරාධි වරදක් ලෙස දක්වා ඇති බවත්ය.

30. ගරු අධිකරණයට ඉහත කරුණු සනාථ කිරීමට 2024 අංක 9 දරණ මාර්ගත ක්‍රම වල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ 20 වගන්තිය පහත උපුටා දක්වන බව පෙත්සම්කරු ප්‍රකාශ කර සිටියි.

**20 (1) (මේ වගන්තියේ "ඉලක්කගත තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් තැනැත්තකුට හිරිහැර කිරීමේ චේතනාවෙන්, ඉලක්කගත තැනැත්තාගේ හෝ ඉලක්කගත තැනැත්තාට සම්බන්ධ තැනැත්තෙකුගේ යම් පෞද්ගලික තොරතුරක් පළ කිරීමෙන් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉලක්කගත තැනැත්තාට හෝ වෙනත් යම් තැනැත්තකුට හිරිහැරයක් සිදු කරවන, ප්‍රකාශයක් සිතාමතා ම සිදු කරන හෝ සන්නිවේදනය කරන ශ්‍රි ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තකු වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබූ විට වසර පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමටකට හෝ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු අතර, දෙවන වර හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට ඒ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩය හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකම හෝ දෙගුණයක් කරනු ලැබිය හැකිය.**

**(2) මේ වගන්තියේ කාර්යය සඳහා**

**අ) පෞද්ගලික තොරතුරු යන්නෙන් යම් තැනැත්තකු විසින් පෞද්ගලික ලෙස තබාගත යුතු බවට සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලැබිය හැකි යම් ඡායාරූපයක්, හඬ පටයක හෝ වීඩියෝ පටයක විස්තර ඇතුලු පුද්ගලික තොරතුරු අදහස් වන නමුත් එයට වෙනත් යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි විය හැකි යම් තොරතුරු ඇතුළත් නොවේ, සහ**

**ආ) හිරිහැර කිරීම යන්නෙන් යම් තැනැත්තකුට තර්ජනය කිරීමේ, තැති ගැන්වීමේ හෝ පීඩාවට පත් කිරීමේ හෝ යම් තැනැත්තකුගේ අභිමානය උල්ලංඝනය කිරීමේ හෝ බියගන්වන සුලු, අවමන් සහගත, එදිරිවාදි, නින්දා සහගත හෝ වරදකාරී පරිසරයක් නිර්මාණය කිරීමේ බලපෑමක් ඇති හෝ ඒ සියලු බලපෑම් ඇති යම් ක්‍රියාවක් හෝ හැසිරීමක් අදහස් වේ.**

31. පෙත්සම්කරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, පෙත්සම්කරුගේ උපරිම විශ්වාසය හා දැනීම අනුව 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන වගඋත්තරකරුවන් විසින් ප්‍රථම වරට උක්ත පනතේ 20(1) වගන්තිය උල්ලංඝනය කරමින් කටයුතු කර ඇත්තේ 2023 වර්ෂයෙහි ජූලි මස හෝ ඊට ආසන්න කාලයක දී බවත්, එසේ වුවද දිගින් දිගටම පෙත්සම්කරුට අදාලව පෞද්ගලික තොරතුරු සන්නිවේදනය කිරීම 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන වගඋත්තරකරුවන් විසින් සිදු කරමින් පවතින බවත්, ඒ අනුව දිගින් දිගටම පෙත්සම්කරු ඉලක්කගත කොට හා පෙත්සම්කරුට හිරිහැර කිරීමේ

චේතනාවෙන් 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන වගඋත්තරකරුවන් කටයුතු කරමින් සිටින බවත්ය.

32. ඒ අනුව 2024 අංක 9 දරණ පනතේ 24(1) වගන්තිය යටතේ උක්ත තොරතුරු සංසරණය කිරීම වැලැක්වීම උදෙසා ආඥාවක් ලබා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට පෙත්සම්කරුට නීතිමය අයිතියක් ඇති බවට පෙත්සම්කරු ප්‍රකාශ කර සිටියි.

33. පෙත්සම්කරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, උක්ත කරුණු මත උක්ත පනතේ 24(2) වගන්තිය යටතේ 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන සහ/හෝ 8 වන වගඋත්තරකරුවන්ට එරෙහිව කොන්දේසි සහිත ආඥාවක් අයැද සිටීමට පෙත්සම්කරුට නීතිමය අයිතියක් ඇති බවයි.

34. තවද ඉහත අයැදීමට අමතරව 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන වගඋත්තරකරුවන් විසින් 2024 අංක 9 දරණ පනතේ 20 වන වගන්තිය උල්ලංඝනය කරමින් කටයුතු කිරීම සිදු කිරීම කරනු ලබන්නේ 7 වන සහ 8 වන වගඋත්තරකරුවන් වශයෙන් දක්වා ඇති අන්තර්ජාල සේවා සපයන්නන් සහ/හෝ අන්තර්ජාල සේවා සපයන්නන් සහ/හෝ අන්තර්ජාල අතරමැදියෙකුගේ මාර්ගත ස්ථාන වලින් වන බැවින් එම සන්නිවේදනයන් දිගින් දිගටම සිදු කිරීම සහ/හෝ සංසරණය වීම වලක්වාලීම උදෙසා එම වගඋත්තරකරුවන්ට අදාලව කොන්දේසි සහිත ආඥාවක් ලබා ගැනීමට පෙත්සම්කරුට නීතිමය අයිතියක් ඇති බවට පෙත්සම්කරු ප්‍රකාශ කර සිටියි.

35. උක්ත 24 වගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් ලබා ගැනීමට අදාල පාර්ශවයන්ගේ තොරතුරු පහත දැක්වේ.

<u>1 වන වගඋත්තරකාරිය</u>

පොල්වත්තේ ඉල්ලන්පෙරුම ආරච්චිගේ ගයත්‍රි බිම්බා
අංක 24/5/1 සඳරැස්වත්ත,
මිරිස්වත්ත,
පුවක්පිටිය.

සහ

No. 66 Dachengli,
Guantian District,
Tainan City,
Taiwan 70005.

<u>2 වන වගඋත්තරකරු</u>

ජනක රාජපක්ෂ
අංක 90/A,
කොට්ටාව පාර,
මිරිස්වත්ත,
පිළියන්දල.

සහ

No. 66 Dachengli,
Guantian District,
Tainan City,
Taiwan 70005.

3 වන වගඋත්තරකරු

ඕශල හේරත්
අංක 22
වට මාවත,
පිළියන්දල.

4 වන වගඋත්තරකරු

යසලාල් පෙරේරා
අංක 14,
ඩඩ්ලි සේනානායක මාවත,
පානදුර.

5 වන වගඋත්තරකරු

කල්ප ගයාන් කවීශ්වර ගුණරත්න
.
.
.

6 වන වගඋත්තරකරු

ජාමුණි කමන්ත තුශාර
අංක 67, නන්දන,
අලුවිල,
පානදුර.

7 වන වගඋත්තරකරු

WhatsApp LLC
Headquarters
1 Meta Way,
Menlo Park,
California 94025,
United States of America.

8 වන වගඋත්තරකරු

Google LLC, D/B/A
Youtube
Headquarters
901 Cherry Avenue,
San Bruno,
California 94066,

United States of America.

36. තවද පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ, 2024 අංක 9 දරණ පනතේ 24(4) වගන්තියේ අවශ්‍යතාවයක් පරිපූර්ණ කිරීම උදෙසා උක්ත වගඋත්තරකරුවන්ගේ විද්‍යුත් තැපැල් ලිපින පහත දක්වා ඇති බවයි.

1 වන වගඋත්තරකාරිය

g.illamperuma@yahoo.com

2 වන වගඋත්තරකරු

janka@mail.tnnua.edu.tw

3 වන වගඋත්තරකරු

oshalah@gmail.com

4 වන වගඋත්තරකරු

pererelal@gmial.com

5 වන වගඋත්තරකරු

.

6 වන වගඋත්තරකරු

7 වන වගඋත්තරකරු

8 වන වගඋත්තරකරු

.

**එසේ හෙයින් උක්ත කරුණු මත පෙත්සම්කරු ගරු අධිකරණයෙන් අයැද සිටින්නේ,**

අ) වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කරන ලෙසත්,

ආ) 2024 අංක 9 දරණ මාර්ගගත ක්‍රම වල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ 24(2) වගන්ති යටතේ මුල් අවස්ථාවේදී කොන්දේසි සහිත ආඥාවක් ඉහත 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන සහ/හෝ 8 වන වගඋත්තරකරුවන්ට වශයෙන් දක්වා ඇති පාර්ශවයන්ට අදාල නිකුත් කරන ලෙසත්,

ඇ) ඉහත කොන්දේසි සහිත ආඥා නිකුත් කිරීමේදී පෙත්සම්කරුට අදාලව කිසිදු **"පෞද්ගලික තොරතුරුක්"** එනම් පෞද්ගලික ලෙස තබාගත යුතු බවට සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලැබිය හැකි ඡායාරූපයක්, හඬපටයක් හෝ වීඩියෝ පටයක් හා වෙනත් පෞද්ගලික තොරතුරක් සන්නිවේදනය කිරීමෙන්, සම්ප්‍රේෂණය කිරීමෙන්, බෙදා හැරීමෙන් හුවමාරු කර ගැනීමෙන්, ජනනය කිරීමෙන්, ප්‍රචාරය කිරීමෙන්, පල කිරීමෙන් හා අයැදීමෙන් ඉහත වගඋත්තරකරුවන් වලක්වාලන්නා වූ කොන්දේසියක්ද ඇතුලත් කරන ලෙසත්,

ඈ) එම කොන්දේසි සහිත ආඥාව 2024 අංක 9 දරණ පනතේ 24(4) වගන්තිය යටතේ භාරදීම ප්‍රමාණවත් බවට නියෝගයක් සිදු කරන ලෙසත්,

ඉ) ඉන් අනතුරුව උක්ත පනතේ 24(1) වගන්තිය යටතේ සති 2 ක කාලසීමාවක් තුළදී ගරු අධිකරණය හමුවේ පෙනී සිටීමට ඉහත 1 වන සහ/හෝ 2 වන සහ/හෝ 3 වන සහ/හෝ 4 වන සහ/හෝ 5 වන සහ/හෝ 6 වන සහ/හෝ 7 වන සහ/හෝ 8 වන වගඋත්තරකරුවන්ට නියෝග කරන ලෙසත්,

ඊ) උක්ත පනතේ 24(8) වගන්තිය යටතේ පෙත්සම්කරුගේ පෙත්සමට අදාලව පරීක්ෂණයක් පවත්වන ලෙසත්,

උ) ඉන් අනතුරුව උක්ත පනතේ 24(7) හෝ 24(8) (ඇ) හා / හෝ 24(8) (ඈ) වගන්තීන් යටතේ නියත ආඥාවක් බවට පරිවර්තනය කරන ලෙසත්,

ඌ) තවද උක්ත පනතේ 24(9) වගන්තිය යටතේ කටයුතු කරමින් උක්ත **"තහනම් ප්‍රකාශයන්"** පිළිබඳ සන්නිවේදන අන්තර්ගත මාර්ගත ස්ථානය වෙත ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් වෙත ද ප්‍රවේශ වීම අක්‍රීය කිරීම සඳහා මුල් අවස්ථාවේදි හා ඉල්ලීම සම්බන්ධයෙන් අවසාන නියෝගයන් දෙන අවස්ථාවේදී මාර්ගගත ක්‍රම වල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව වෙත ආඥාවක් නිකුත් කරන ලෙසත් හා / හෝ ඒ සන්නිවේදනය අන්තර්ගත මාර්ගගත ස්ථානය අදාල තහනම් ප්‍රකාශය පිළිබඳ සන්නිවේදනය ඉවත් කිරිම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස මාර්ගගත ක්‍රම වල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව වෙත නියෝගයක් නිකුත් කරන ලෙසත්,

එ) ගරු අධිකරණයට සුදුසු යැයි හැගෙන අන් සෑම සියලු සහනයක්ම ලබාදෙන ලෙසත්ය.

**පෙත්සම්කරුගේ නීතිඥ**